# බේරුවල නගර සභාව

01. සේවා ගණනය හා තනතුරු නාමය : ප්‍රාථමික අර්ධ ශිල්පීය වඩු කාර්මික III ශ්‍රේණිය

02. පුරප්පාඩු ගණන : 01

03. සුදුසුකම්

03.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) ක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් විය යුතුය.)

03.2. වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළව නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම.

සහ

අවම වශයෙන් සහ අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතික මගින් සනාථ කල යුතුය)

04. පළපුරුද්ද :

04.1 බාහිර අයදුම්කරුවන් සඳහා : අදාළ නොවේ.

04.1 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා : අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 05 ක සපුරා ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වසර 05 ක සතුටුදායක සේවා කාලය සපුරා ඇති සේවකයෙකු විය යුතු ය.

05. වැටුප් :

05.1 වැටුප් කේත අංකය : PL2-2016 (රා . ප . ච . 03/2016 අනුව)

05.1 වැටුප් පරිමාණය රු. 25,250-10×270-10×300-10×330-12×350- රු.38,450/-

06. බඳවා ගැනීමේ ක්‍රමය :

06.1. විවෘත බඳවා ගැනීම :

06.1.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

06.1.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

06.1.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරේ.

06.1.4.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| සාමාන්‍ය දැනීම | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

***සටහන*** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

06.2. සීමිත බඳවා ගැනීම :

06.2.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

06.2.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

06.2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරේ.

06.2.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| සාමාන්‍ය දැනීම | 75 | |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

*සටහන* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

06.3. කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

* සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකිවන අවස්ථාවලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
iii. බේරුවල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
iv. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු විය යුතුය හා අවු: 45 ට නොවැඩි විය යුතුය. (තනතුරට අදාළ වන පරිදි දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව සීමිත බඳවා ගැනීම සඳහා බලපානු නොලැබේ)
v. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
vi. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
vii. රජයේ හෝ පළාත් පාලන ආයතනයක සේවයෙන් පහ කරනු නොලැබූ අයකු විය යුතු ය.
viii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුය.
ix. බඳවා ගැනීම් පරිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට, ප්‍රායෝගික පරීක්ෂණයකට, වෘත්තීය පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.
x. එක් එක් තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලු අවම සුදුසුකම් ගැසට් පත්‍රයේ සඳහන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
xi. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවා ගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධන වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම්, වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම බේරුවල නගර සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ පොදු කොන්දේසි* :

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.

2. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

3. තනතුරුවලට අදාළ වැටුප් පරිමාණයන් සඳහා 2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි II වන උපලේඛනය අනුවවේ. එම වැටුප් පරිමාණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2020.01.01 දින සිටය.

4. මීට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කළ බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කළ පනවනු ලබන රෙගුලාසි *නොහොත්* නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු ය.

04. *අයදුම් කළ යුතු ආකාරය* :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ4 ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2019.01.18 දිනට පෙර "ලේකම්, බේරුවල නගර සභාව, බේරුවල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල පිටපත් එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය,
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්,
iii. අධ්‍යාපන සහතික/ පාසල හැර යාමේ සහතිකය,
iv. ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
v. වෙනත් සුදුසුකම් දක්වෙන සහතික,
vi. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
vii. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්,
viii. පොලිස් වාර්තාව.

පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට/ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන අතර, එම කැඳවීම ලද පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුසුසෙකු ලෙස නොසැලකිය යුතුය.

* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූර්ණ බලතල මා සතු වන අතර මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය බේරුවල නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

* මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලත්වයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය නිරවද්‍ය ලෙස බල පැවැත්වෙන්නේ ය.

ඩබ්ලිව්. ඒ. අජිත් කිත්සිරි,
ලේකම්,
බේරුවල නගර සභාව.

2018 දෙසැම්බර් මස 18 වැනි දින,
බේරුවල නගර සභා කාර්යාලයේ දීය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බේරුවල නගර සභාව

**.......................................................... තනතුර සඳහා ආදර්ශ අයදුම්පත්‍රය.**

01. (අ) මුලකුරු සමග නම :————————
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————
02. ස්ථිර ලිපිනය :————————
03. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————————
04. දිස්ත්‍රික්කය :————————
05. උපන් දිනය : අවුරුද්ද :———— මාසය :———— දිනය :————
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2019.01.18) වයස :
අවුරුදු :———— මාස :———— දින :————
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————————
07. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:————————
08. ජාතික හැඳුනුම්පත් අංකය:————————
09. දුරකථන අංකය :————————
10. විවාහක/අවිවාහක බව :————————

11. පළමු පත්වීම් දිනය (සීමිත අයදුම්කරුවන් සඳහා) :————————————————

12. අධ්‍යාපන සුදුසුකම් :

12.1 අයදුම්කරු අවසන්වරට සමත් වූ පන්තිය:————————————

12.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

I. වර්ෂය :——————— මාසය :———————

II. විභාග අංකය :———————

III. ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

12.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය :

I. වර්ෂය :——————— මාසය :———————

II. විභාග අංකය :———————

III. ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————————————

14. වෙනත් සුදුසුකම් :————————————

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?/නැතිද? යන වග :———————

16. ඔබ දැනටමත් මෙම නගර සභාවේ ස්ථිර, ආදේශක, අනියම්, තාවකාලික, ව්‍යාපෘති පදනම යටතේ සේවය කරන්නේ ද? එසේනම් එම සේවා කාලය හා විස්තර :————————————

17. තනතුර :————————————

18. සේවා කාලය : අවුරුදු :————— මාස :————— දින :—————

19. ගතවූ වසර 05 තුළ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද ?

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

.............................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :—————

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

01. මෙම අයදුම්කරු/අයදුම්කාරිය .............................................................................................. මයා/ මිය මෙම නගර සභාවේ සේවයේ නියුතු අයෙකු බව ද,

02. ඔහු/ ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,

03. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බව ද,

04. ඔහු/ඇය *ගැසට්* නිවේදනයේ දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05 ක් තුළ සක්‍රීය හා සතුටුදායක සේවය සම්පූර්ණ කර ඇති බවද,

05. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම *ගැසට්* නිවේදනයේ දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායක පැවති බවද,

06. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,

07. මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :——————.

12 - 956/2